# ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර සංස්ථාව

## පුරප්පාඩු

**ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**කලමනාකාර / ජ්‍යෙෂ්ඨ කළමනාකාර (තත්ව පාලන) (MM 1-1)**

**සුදුසුකම්**
**බාහිර අපේක්ෂකයින්**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ජීව විද්‍යාව/භෞතික විද්‍යාව/රසායන විද්‍යාව පිළිබඳ උපාධික් ලබා තිබීම.

සහ

02. රාජ්‍ය ආයතනයක/ සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/ පිළිගත් වාණිජ ආයතනයක පළමු වන උපාධිය ලබා ගැනීමෙන් පසු, මසුන්ගේ තත්ව පාලනයට අදාළ කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අපේක්ෂකයින් ((පහත 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා තිබීම
02. කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (JM 1-1) II වන ශ්‍රේණියේ මසුන්ගේ තත්ව පාලනයට අදාළ කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

වැටුප : **MM 1-1- 2025 Rs. [91690 – 10x2480– 15 x3450-168240]**
**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩුකර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2. සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක ප්‍රදානයන් බැර කරනු ලැබේ.
3. රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් / හෝ දීමනා.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයවිය යුතු වේ.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(ආ)රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026.06.07** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : chairman@cfc.gov.lk)

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක 0112-540455